# An analysis of "Chuti citta" in the Theravada Tradition

## ථේරවාද සම්ප්‍රදායෙහි චුති චිත්ත විභාගය

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

පුද්ගල සාංසාරිකත්වය හෙවත් භවගාමීත්වය ථේරවාදී දාර්ශනික චින්තනයන් තුළින් පමණක් නොව ආදි බුදුසමයේ ද නොයෙකුත් අවස්ථාවල විග්‍රහ වී ඇති කරුණකි.[1] මේ පිළිබඳ අදහස් ප්‍රාග් බෞද්ධ යුගයේ පටන් සංවර්ධනය වී ඇති බව වෛදික ග්‍රන්ථ අධ්‍යයනයේ දී දක්නට ඇත.[2] ''භව'' යන පදය ''භූ'' ධාතුවෙන් නිපන්නකි. එයට ''අ'' විකරණය එක්වීමෙන් ''භව'' යන ක්‍රියාමූලය නිර්මාණය වී ඇත. ඒ තුළ ''වෙයි'' යන භාෂාමය අර්ථය යෙදී ඇත. නමුත් මෙය ආගමික දාර්ශනික වශයෙන් යෙදෙනුයේ භවගාමීත්වයක් දැක්වීම සඳහා ය. එනම් මමය, මාගේය යන හැඟීම හෙවත් අස්මිමානය හා බැඳගත් පැවැත්ම "භවය" ලෙස දක්වා ඇත. ථේරවාදී සම්ප්‍රදාය තුළ පුද්ගල භවගාමීත්වය ද්වායාකාරව දක්වා ඇත. එනම් "කම්ම භව" හා "උප්පත්ති භව"[3] යනුවෙනි. එයින් කම්ම භවය ඵලූපචාරයෙන් ද, උප්පත්ති භවය මුඛ්‍යාර්ථයෙන් ද පෙන්වා දී ඇත. මෙහි ''කම්ම'' ලෙස දක්වා ඇත්තේ ප්‍රධාන වශයෙන් චේතනාව යි. චේතනාව හා යෙදෙන අභිධ්‍යාදී ධර්මයන් ද එයට ඇතුළත් වේ. ***''සබ්බං භවගාමී කම්මං කම්මභවො''*** යනුවෙන් සියලු භවගාමී කර්මයන් "කර්ම භව" ලෙස දක්වා ඇත. කර්මයෙන් හටගත්තා වූ

---

1

- තයො මෙ භික්ඛවෙ භවා, කාම භවො, රූප භවො, අරූප භවො

  සං. නි. II, විභංග සූත්‍රය, පි. 4.

- භව නිරොධො නිබ්බාණන්ති

  සං. නි. II, කොසම්බි සුත්ත, පි. 186.

- භව දිට්ඨී ච. විභව දිට්ඨී ච

  දී. නි. III, සංගීති සුත්ත.

- සෙය්‍යථීදං කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා

  සං. නි. IV, ධම්මචක්කපවත්තන සුත්ත, පි. 270.

2

- ඍග් වේද X 6. 10
- ශ්වේතාශ්වර 1.1
- බෘහදාරණ්‍යක IV. 3.23

3 තත්‍ථ භවතීති භවො. සො කම්ම භවො උප්පත්ති භවොචාති දුවිධො හොති

විසුද්ධි මාර්ගය, ධම්මවංශ හිමි, මාතර, පි. 350.

ස්කන්ධ "උප්පත්ති භව" නම් වේ. එය කොටස් නවයකට බෙදා දක්වා ඇත.[4] කර්ම කරන්නා වූ පුද්ගලයා එම කර්මානුරූපව උපදින ස්ථාන උප්පත්තිභව යන්නෙන් අදහස් කරන බව පැහැදිලි වේ. ඒ ඒ භවයන්හි හටගන්නා වූ උපාදානස්කන්ධයන් මෙයින් අදහස් කොට ඇත.

***''අවිසෙසෙන උපාදාන පච්චයා කාමභවූපගං කම්ම කම්මභවො තදභිනිබ්බත්තාඛන්ධා උප්පතිතිභවො''***[5]

යනුවෙන් මෙය තවදුරටත් ථෙරවාද අට්ඨකතා තුළ විග්‍රහ කොට ඇත. උක්ත විවරණයන්ට අනුව පුද්ගල භවගාමීත්වය පැහැදිලි ය. එසේම මෙම පුද්ගල භවගාමීත්වය කෙසේ සිදුවන්නේ දැයි අධ්‍යයනය කළ යුතු වේ. ථෙරවාද සම්ප්‍රදායේ මෙන් ආදි බෞද්ධ මූලාශ්‍රය තුළ ද මේ සඳහා පිළිතුර ලෙස ලබා දී ඇත්තේ ***''උපාදාන පච්චයා භවො''*** යන්න යි. මේ අනුව භවය සඳහා ප්‍රධාන කාරකය වන්නේ උපාදානය හෙවත් දැඩිව අල්ලාගැනීම[6] යි. එය තෘෂ්ණාව මූලිකව සිදුවන්නකි. මෙහි ''උප'' යන පදය තුළින් ''දැඩිව'' යන අරුත ද ''ආදාන'' යන පදයෙන් ''අල්ලා ගැනීම'' යන්න ද දක්වා ඇත. මෙසේ සත්වයා විසින් උපාදානය කරගනු ලබන ධර්ම සතරකි. එනම්,

i. කාමූපාදානය
ii. දිට්ඨූපාදානය
iii. සීලබ්බතූපාදානය
iv. අත්තවාදූපාදනය

මෙම සියලු උපාදානයන් සඳහා පදනම තෘෂ්ණාව ලෙස දක්වා ඇත. එසේම ඉහත දැක්වූ ආකාරයට පුද්ගලයාගේ භවගාමීත්වය සඳහා කර්මය ප්‍රමුඛ කාරණයක් වේ. එබැවින් කර්මයේ ඵල අවස්ථාව ලෙස භවය දක්වා ඇත. ***''ඵල වොහාරෙන භවොති වෙදිතබ්බො''*** පටිච්චසමුප්පාදයේ දෙවන අංගය ලෙස විස්තර වන්නා වූ ''සංඛාර'' යනු ද මෙම කර්මයෝම ය. එය කුසල හා අකුසල හා ආනෙඤ්ජ යනුවෙන් තුන් ආකාර වේ. පුද්ගල භව බීජය වන විඤ්ඤාණය[7] සඳහා ක්ෂේත්‍රය වන්නේ ද කර්මය යි. තෘෂ්ණාව එම භව බීජය වැඩෙන්නට යොදන්නා වූ ජලය ලෙස දක්වා ඇත. මෙසේ අවිද්‍යා

---

[4] කාමභව, රූප භව, සඤ්ඤා භව, අසඤ්ඤා භව, නෙවසඤ්ඤානාසඤ්ඤා භව, එකවොකාර භව, චතුවොකාර භව, පඤ්චවොකාර භව.

එම, පි. 436.

[5] විසුද්ධිමග්ග, පි. 449.

[6] උපාදානන්ති දළ්හ ගහණං

විසුද්ධිමග්ග පි. 510.

[7] ඉති ඛො ආනන්ද කම්මං ඛෙත්තං විඤ්ඤාණං බිජං තණ්හා සිනෙහො

අං. නි. I, ආනන්ද වග්ග, බු. ජ. මු., පි. 394.

නීවරණයෙන් ආවරණය වූ තෘෂ්ණා සංයෝජනයෙන් බැඳුණු සත්වයාගේ විඤ්ඤාණය කාම ධාතුවෙහි පිහිටීමෙන් පුනර්භවය සිදු වේ.[8]

පුනර්භවය පිළිබඳ වූ උක්ත ආදි බෞද්ධ ඉගැන්වීම් දාර්ශනික වශයෙන් සංවර්ධනය වී නිකායාන්තර බුදුසමය තුළ තවදුරටත් සාකච්ඡා කොට ඇත. මේ පිළිබඳ ථෙරවාදී ආකල්පය විමසීමේ දී පළමුව ථෙරවාදී සම්ප්‍රදායේ පුද්ගල මරණය ලෙස දක්වන්නේ කුමක්දැයි විමසිය යුතු වේ.

මේ පිළිබඳ එක් අදහසක් ම. මූ. සම්මාදිට්ඨි සුත්ත වණ්ණනාවේ දැකගත හැකි වේ. එහි දී ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව නිකායන්ගෙන් චුතවීම, චුතවන බව, බිඳීම, අතුරුදහන් වීම, මෘත්‍යු මරණය, කළුරිය කිරීම, ස්කන්ධ බිඳීම, සිරුර අතහැරීම මරණය ලෙස විග්‍රහ කොට ඇත.[9] මෙය වනාහි මරණය පිළිබඳ එක් සත්ව කොට්ඨාශයකට පමණක් අදාළහැඳින්වීමක් නොවේ. සකල ලෝක සත්ව වර්ගයාගේ ම මරණය පිළිබඳ වූ පෘථුල වූ සංඥාපනයකි. මෙය මරණය පිළිබඳ හැඳින්වීමක් මිස ඒ පිළිබඳ වූ නිර්වචනයක් ද නොවේ. මෙම හැඳින්වීම තුළ ඉස්මතු වන්නා වූ ප්‍රධාන ඉගැන්වීමක් දැකගත හැකිය. එනම් සත්වයා මරණයෙන් පසු අවසාන නොවන බවයි. ***''තම්හා තම්හා සත්ත නිකායා''*** යනුවෙන් අවධි විභක්තියෙන් පද යෙදීමෙන් ඒ බව පැහැදිලි වේ. එසේම උක්ත විග්‍රහයේ දැක්වෙන ***''ඛන්ධානං භෙදො''*** යන්න තුළින් මරණය යනු ස්කන්ධ ධර්මයන්ගේ බිඳී යාම ලෙස දක්වා ඇත. මෙහි දී ''විනාසං'' යන පදය වෙනුවට ''භෙදො'' යන පදය යෙදීමේ දාර්ශනික අගයක් පවතී. එනම් මරණය තුළ සිදු වී ඇත්තේ මෙම භවයේ ස්කන්ධයන්ගේ බිඳී යාමක් මිස එහි විනාශයක් නොවන බවයි.

එසේම මරණය පිළිබඳ දක්නට ඇති තවත් වැදගත් විග්‍රහයක් නම් ***''එක භව පරියාපන්නස්ස ජීවිතින්ද්‍රිය උපච්ඡේදො මරණං''***[10] (එක් භවයක් ඇතුළත ජීවිතින්ද්‍රියාගේ බිඳීම මරණය නම් වේ.) මෙහි දී ද මරණය ලෙස අර්ථ දක්වා ඇත්තේ එක් ජීවිත ඉන්ද්‍රියක බිඳීයාම පමණි.

මීට අමතර උක්ත සංකල්පය පිළිබඳ ඉතා වැදගත් වූ විවරණයක් අටුවා සාහිත්‍යයේ දක්නට ඇත. ඒ සඳහා මහාවේදල්ල සූත්‍රාගත පහත දේශනාව පදනම් වී ඇත.

***''යදා ඛො ආවුසො ඉමං කායං තයො ධම්මා ජහන්ති ආයුස්මා ච විඤ්ඤාණං අථායං කායො උජ්ඣිතො අවක්ඛිතො සෙති යථා කට්ඨං අචෙතනං...''***

***''ආයුස්මා ච විඤ්ඤාණං - යදා කායං ජයන්තිමං***

---

[8] අවිජ්ජා නිවරණානං සත්තානං තණ්හා සංයොජනානං හීනාය ධාතුයා විඤ්ඤාණං පතිට්ඨිතං එවං ආයති පුනබ්භවාභිනිබ්බානන්ති හොති.

අං. නි. I, ආනන්ද වග්ග, බු. ජ. මු., පි. 394.

[9] කතමඤ්ච භික්ඛවෙ මරණං යං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භෙදො අන්තරධානං මච්චු මරණං කාලකිරියා ඛන්ධානං භෙදො කලෙබරස්ස නික්ඛෙපො ජීවිතින්ද්‍රියස්සුපච්ඡෙදො ඉදං වුච්චති භික්ඛවෙ මරණං.

ම. වූ., සම්මාදිට්ඨි සුත්ත, I

[10] විසුද්ධිමග්ග, පි. 229.

*අපවිද්ධො තදා සෙති - නිරත්‍ථං ව කලිංගරං"*[11]

මෙම දේශනා පාඨයට අනුව සත්‍වයාගේ මරණය ලෙස දක්වන්නේ ආයුෂ, උෂ්ණ සහ විඤ්ඤාණ යන ධර්මත්‍රයේ බැහැරවීම යි. ධම්මපාල හිමියන් මළ සිරුර (මතකලෙබර) මෙන්ම, මළගිය තැනැත්තා ලෙස නිර්වචනය කොට තිබෙන්නේ ද මේ ධර්ම තුනෙහි අවිද්‍යමානත්‍වය යි. මේ පිළිබඳ අදහස් දක්වන ආචාර්ය බුද්ධඝෝෂ පාදයෝ ද සිය අට්ඨකතා තුළ ශරීරය නැගිට සිටීම, ඇවිදීම වැනි ක්‍රියා (ඨානගමනාදික්කමො) සිදු කරන්නේ මෙම ධර්ම තුනෙහි සහාය ලබාගෙන බව දක්වා ඇත. මේවා බැහැර වූ විට ශරීරය දිරාපත් වුණු කුණක් බවට පත්වීම (පූතිකසභාවො) ස්වභාවික[12] බව එහි සඳහන් වේ. ආදි බුදුසමයට අනුව සත්‍වයා ලෙස විග්‍රහ කරනුයේ ස්ඛන්ධ ධර්මයන් පහේ (05) එකතුවකි.[13] එසේම ඉන් පරිබාහිර වූ කිසිවක් එහි නොමැති බව දැක්වේ. මේ අනුව ආදි බුදුසමයේ පුද්ගල විග්‍රහයන් හා ථෙරවාද සම්ප්‍රදායානුගත මරණයපිළිබඳ සාධකයනුත් සැසඳීමේ දී ආයු, ඌෂ්ණ, විඤ්ඤාණ යන ධර්මතා ස්කන්ධ ධර්මයන් තුළ ඇතුළත්ව ඇති බව පෙනේ. මෙහි දී ''විඤ්ඤාණ'' යන්න පැහැදිලිවම ස්ඛන්ධ ධර්මයන් තුළ දක්නට ඇති අතර, ආයු, ඌෂ්ණ, යන ධර්මතා ස්ඛන්ධයන්ගේ කවර කොටසකට ඇතුළත් දැයි විමසිය යුතු වේ. මේ පිළිබඳ මූලික සූත්‍ර දේශනා තුළ කිසිදු දේශනාවක් දක්නට නොමැති බැවින් මේ සඳහා ආභිධර්මික විග්‍රහයන් වෙත යොමු වීම ඉතා වැදගත්ය.

අභිධර්ම විවරණයන්ට අනුව පුද්ගලයා ලෙස සළකනු ලබන්නේ රූප හා අරූප ජීවිතීන්‍ද්‍රිය යි. මෙම ජීවිතීන්‍ද්‍රිය තුළින් සියලු ස්ඛන්ධ ධර්මයන් පාලනය කිරීම සහ ඒවා එකිනෙක රඳවා ගැනීම සිදුකරනු ලබයි. ජීවිතීන්‍ද්‍රිය ද ස්ඛන්ධ ධර්ම පදනම් වී ඇත. එම නිසා එයට ජීවිතීන්‍ද්‍රිය යැයි කියනු ලබයි.[14] ජීවියෙකු හෙවත් සත්‍වයෙකු යනු ජීවිත ඉන්‍ද්‍රියෙන් බඳනා ලද ස්ඛන්ධ පඤ්චකයෙහි සන්තතියකි.[15] අභිධර්ම විග්‍රහයන්හි දී මෙම ජීවිතීන්‍ද්‍රිය ''ආයු'' ලෙස ද දක්වා ඇත. එසේම එය උෂ්ණ ධර්මතාවය සමඟ එකට බැඳි පවතී. මහාවේදල්ල සූත්‍රයේ මෙම ධර්මතාවන් පහන්සිල හා එහි දැල්ල මෙන් එකිනෙකට බැඳී පවතින බව දක්වා ඇත.

එසේම මෙම ධර්මතා දෙකම විඤ්ඤාණය හා වෙන්කළ නොහැකි ලෙස බැඳී පවතී. මෙසේ ආයු, උෂ්ණ හා විඤ්ඤාණ යන ධර්මතාවයන් තුන එකිනෙකට බැඳී පවතින අතර, ඒ සියල්ල ජීවිතීන්‍ද්‍රිය

---

[11] ම. නි. I, පිටු. 295-196.

[12] මජ්ඣිම නිකාය අට්ඨකථා I, පි. 273.

[13] යථාපි අංගසම්භාරා - හොති සද්දොරථො ඉති
එවං ඛන්තෙසු සන්තෙසු - හොති සත්තොති සම්මුති

[14] ජීවන්ති තෙන සහජාතධම්මා ති ජීවිතං තදෙව ඉන්ද්‍රියන්ති ජීවිතින්ද්‍රියං.

පරමත්ථමංජුසා, පි. 442.

[15] පාණොති ජීවිතින්ද්‍රිය පටිබද්ධා ඛන්ධ සන්තති.

විනය අට්ඨකතා, පි. 26.

මත රඳා පවතියි. මරණය ලෙස අර්ථවත් වන්නේ එක් භවයකට හිමි මෙම ජීවිතීන්‍ද්‍රිය කැඩී යාමයි.[16] මෙසේ සියලු ස්කන්ධයන් පාලනය කරන්නා වූ ජීවිතීන්‍ද්‍රිය එය පාලනයෙන් තොර වුවහොත් හෙවත් විසංයුක්ත භාවයට පැමිණියහොත් සියලු ස්කන්ධයන් ද විසිරී යනු ඇත. එය මරණය ලෙස දක්වයි. මෙසේ අටුවාචාරීන් වහන්සේලාගේ මරණය පිළිබඳ විග්‍රහයන් තුළ එය උපයාගත් ඛන්ධ අතහැර දැමීමක් (උපාදින්නක්ඛන්ධ පරිච්චාග) සහ ජීවිතීන්‍ද්‍රිය කැඩීයාමක් (ජීවිතීන්‍ද්‍රියස්ස උපච්ඡේද) ලෙස දක්වයි.[17] යමකින් යමක් පවත්වාගෙනු එනු ලැබේ ද එය කැඩී යාමෙන් කය ද බිඳ වැටේ.[18] යනුවෙන් ධම්මපාල හිමියෝ ද මරණය ගැන විවරණ කොට ඇත.

ථෙරවාදී සම්ප්‍රදාය තුළ මරණය ලෙස විග්‍රහවන ජීවිතීන්‍ද්‍රිය බිඳ වැටීම යන්න නිරන්තරයෙන් ම දක්වා ඇත්තේ ඒකවචනයෙනි. එයින් අදහස් වන්නේ රූප ජීවිතීන්‍ද්‍රියාගේ බිඳවැටීම පමණි. එසේම මරණය යන්න විග්‍රහය තුළ දැක්වෙන ''බිඳියෑම'', ''කඩාවැටීම'', තොරවීම'', ''බැහැරවීම'' පද තුළින් ද ඉස්මතු වන්නා වූ කරුණක් වේ. එනම් මරණය තුළ සත්වයාගේ නැවැත්මක් හෝ විනාශයක් නොමැති බවයි. ඒ තුළින් පුද්ගලයාගේ සාංසාරිකත්වය, භවගාමීත්වය අර්ථ දක්වා ඇත. එහෙයින් භවගාමීත්වය තුළ යම් ධර්මතාවයක පැවැත්මක් ථෙරවාදය තුළ දක්වන බව සිතිය හැකිය.

මරණයෙන් අනතුරුව ථෙරවාද න්‍යායට අනුව සත්වයාගේ උපත පිළිබඳ විග්‍රහ කරනු ලබයි. එහි දී සත්වයෙකුගේ ඉපදීමක් ලෙස දැක්වෙන්නේ ඒ ඒ සත්ව නිකායන්හි ඉපදීම, හටගැනීම, ස්කන්ධයන්ගේ පහළවීම, ආයතනයන්ගේ නිර්මාණය ආදිය යි.[19] මේ අනුව සත්වයාගේ මරණයත් නැවත ඉපදීමත් යන කරුණු දෙක එකිනෙකට අනුපූර්වම සිදුවන බව දක්වා ඇත. ඒ තුළින් ථෙරවාදී සම්ප්‍රදාය චුති චිත්තය තුළින් මරණයත් ප්‍රතිසන්ධි චිත්තය තුළින් නැවත ඉපදීමත් සිදුවන අයුරු විග්‍රහ කරයි.

පපඤ්චප්පකරණ අට්ඨකථාවට අනුව පුද්ගල ජීවිතය ලෙස දක්වා ඇත්තේ ප්‍රතිසන්ධි චිත්තයේ පටන් චුති චිත්තය දක්වා යන කාලය යි.[20] ඒ අනුව පුද්ගලයෙකුගේ මෙම භවයෙහි ඇතිවන්නා වූ

---

16 තත්‍ථ මරණන්ති එකභවපරියාපන්නස්ස ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදො

විසුද්ධිමග්ග, පි. 427.

17

- විසුද්ධිමග්ග, පි. 427.
- උදාන අට්ඨකතා, පි. 418.
- ඉතිවුත්තක අට්ඨකතා, පිටු. 72-96.

18 යෙන තිට්ඨති තස්ස උපච්ඡෙදෙනෙව කායො භිජ්ජතීති.

පරමත්‍ථ මංජුසා, පි. 420.

19 කතමා ච භික්ඛවෙ ජාති යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො අයං වුච්චති භික්ඛවෙ ජාති.

දී. නි., මහාසතිපට්ඨාන සුත්ත.

20 පටිසන්ධිතො යාව චුති චිත්තා සත්තො ජීවති නාම.

පපඤ්චප්පකරණ අට්ඨකතා

අවසාන චිත්තය ලෙස ''චුති චිත්තය'' දැක්වේ. ඉන් අනතුරුව භව ව්‍යුච්ඡේදය හෙවත් මේ භවයේ අවසානය සිදු වේ.

චුතිය යනු හුදෙක් ස්වාධීන ක්‍රියාවක් නොවේ. එය වඩාත් සියුම් ලෙස දක්වන අටුවාව පරමාර්ථ වශයෙන් සත්‍වයන්ගේ ඉවත්ව යාම "චුතිය" ලෙස දක්වයි. මේ පිළිබඳ විසුද්ධිමාර්ගයේත්, විභංග අටුවාවේත් මෙසේ දක්වා ඇත.

''අතීත භවයේ දී ස්වභාවම වශයෙන් හෝ අන්‍ය උපක්‍රමයකින් හෝ මරණය ළං වූ විට අංගප්‍රත්‍යංගයන්ගේ සම්බන්ධකම් සිඳ දමන්නා වූ මරණාන්තික වේදනාවන් ඉවසිය නොහැකිව, අව්වේ දැමූ තල් කොළයක් මෙන් ක්‍රමයෙන් ශරීරය වේලී යන කල්හි, හෙවත් අප්‍රාණික වෙන කල්හි චක්ෂුරාදී ඉන්ද්‍රියයන් නිරුද්ධ වූ කල්හි කායේන්ද්‍රිය - ජීවිතීන්ද්‍රිය - මනේන්ද්‍රිය - හෘදය වස්තුව ආශ්‍රය කොටගෙන පවත්නා කල්හි මනේන්ද්‍රිය නැමැති සිත තමා ජීවත්ව සිටිය දී බරපතල ලෙස සැලකූ කර්මයක් හෝ නිතර කළ කර්මයක් හෝ අරමුණු කොටගනී. නැතහොත් ඒ කර්මය කරන කාලයේ දී ඒවා කිරීමට උපකාර වූ දාන - වස්තු - මල් - සුවඳ - ආයුධ - දැල් ආදී කර්ම නිමිත්තක් හෝ මින්පසු උපදින භවයේ දී දකින්නට ලැබෙන උයන් - පොකුණු - ගිනිදැල් ආදී ගති නිමිත්තක් හෝ ඔහුගේ සිතට අරමුණු වෙයි. මේ පුද්ගලයා තෘෂ්ණා, අවිද්‍යා දෙක දුරු නොකළ බැවින් මේ අරමුණු ගැනීමේ දෝෂය අවිද්‍යාව විසින් වසනු ලැබේ. තෘෂ්ණාව ඔහු ඒ දෙසට හරවයි. ඒ සමඟ තිබෙන කුශලාකුසල ධර්මයෝ ඔහු එහාට තල්ලු කරනු ලබයි. මෙසේ තල්ලු කරනු ලබන පුද්ගලයා අගලකින් එහා පැත්තේ තිබෙන ගසක බැඳි කඹයක කොන මෙහා පැත්තේ සිට අල්වාගෙන කඹයේ එල්ලී අගලෙන් එගොඩ යන මිනිසෙකු මෙන් පෙර ජාතියේ අත්හරින සිත එයින් වෙන්වෙන බැවින් "චුති චිත්ත" යැයි කියනු ලැබේ.

එසේම චුති චුත්තය පහළ වන්නා වූ මරණාසන්න චිත්ත වීථියේ සිත් උපදින ආකාරය ද අටුවා විවරණ තුළ දක්නට ඇත. ''කර්ම - කර්ම නිමිත්තාදියක් අරමුණු වූ විට භවාංග සිත දෙවරක් ඉපදී නිරුද්ධ වෙයි. අනතුරුව මනෝද්වාරාවජ්ජන චිත්තය උපදියි. මරණාසන්නයේ දී වේගය මඳ බැවින් ජවනය පස්වරක් උපදියි. තදාලම්භණයෝ ද දෙවරක් උපදියි. ඉක්බිතිව මේ භවයේ දී භවාංගයට අරමුණ වූ අරමුණුම ගෙන එක් චුති චිත්තයක් උපදියි. මෙසේ භවංග දෙක ය. මනෝද්වාරාවජ්ජනය, ජවන පසය, තදාලම්බන දෙක ය, චුති සිත යැයි චිත්තක්ෂණ එකොළසක් නිර්මාණය වී ඇත.

ඉන් අනතුරුව එක් චිත්තවීථියක චිත්ත ලක්ෂණ සතළොසක් ඇති බැවින් දෙළොස්වෙනිව පෙර කී කර්ම නිමිත්තාදියෙන් එකක් අරමුණු කරගෙන ප්‍රතිසන්ධි සිත උපදී. ඉන් පසුව උපදින සිත් අන් භවයක් හා සම්බන්ධ වෙති. මෙසේ ථෙරවාද විවරණයන්ට අනුව චුතියත් ප්‍රතිසන්ධියත් සිදුවන්නේ එකම චිත්ත වීථියක් තුළ ය. මේ නිසා අන්තරාභවික අවස්ථාවක් ථෙරවාදයේ අර්ථවත් නොවේ.

මීට අමතරව අභිධම්මාවතාරයෙහි මෙන්ම, අභිධම්මත්ථ සංග්‍රහයෙහි ඉහත දැක්වූ චුති චිත්තය නිර්මාණය වීම සඳහා එනම් ඒ සඳහා පදනම් වන්නා වූ කර්මය මේරීම හා විපාක දීම සම්බන්ධව බලපවත්නා වූ කරුණු සතරක් දක්වා ඇත. එනම්,

1. ආසන්න (බර සහිත)

2. ආසන්න (සමීප)
3. ආචිණ්ණ (චිර භාවිත)
4. කටත්තා (සිදු කරන ලද)[21]

මේ කරුණු සතර මරණ අවස්ථාවේ දී අදාළ වන බව පැහැදිලිවම දක්වා තිබේ. එනම් මෙම අවස්ථාවේ දී සත්ත්වයෙකු තම ජීවිත කාලය පුරාවටම සිදුකොට ඇති කර්මවලින් ඔහුගේ පුනරුත්පත්තිය කෙරෙහි බලපානු ලබන කර්මය කුමක්දැයි තීරණය වේ. එම සත්ත්වයා විසින් කිසියම් ගරුක කර්මයක් කොට තිබේනම් එය අනිකුත් කර්ම අභිබවා සත්ත්වයාගේ අවසාන චිත්තය කෙරෙහි බලපවත්නේ ය. ගරුක කර්මයන් නොමැති නම් අඩුතරමින් මරණාසන්නයේ දී කරන ලද හෝ සිහි කරන ලද කිසියම් වැදගත් කර්මයක් චුති චිත්තයට බලපානු ලබන බව අභිධම්මත්ථ සංග්‍රහයේ දැක්වේ. මේ දෙකම නැති කල්හි බහුල වශයෙන් කරන ලද කර්ම ඒ කෙරෙහි බලපානු ලබයි.[22] ආභිධම්මික ග්‍රන්ථයන් තුළ දක්නට ලැබෙන මෙම ප්‍රකාශ තුළින් පෙනී යන්නේ මතකය විසින් අතීත කර්ම එක්තරා ආකාරයකින් පුනර්ජීවනය කරනු ලබන බවයි. එනම් කර්ම සත්‍ය වශයෙන් ම කරන ලද අවස්ථාවේ දී මෙන් ම එම අවස්ථාවේ දී ද පුද්ගලයා විසින් කුශල වූ හෝ අකුශල වූ හෝ එම කර්ම ඒ ආකාරයෙන් ම අත්දකින බවයි. ප්‍රතිසන්ධි චිත්තයට හෝ භවංග චිත්තයට ඍජුව බලපානු ලබන්නේ මෙම කර්මයෝ ය. කර්ම නිමිති යනු අතීත හෝ වර්තමාන ඉන්ද්‍රියානුබද්ධ අරමුණු වේ. මෙහි දී සිදුවන්නේ ද අතීතයෙහි එක්තරා කර්මයක් හා සම්බන්ධ වූ වස්තුවක් මරණය වන්නා වූ අවස්ථාවේ දී පුද්ගලයාගේ මනසට යොමුවීමත්, එමඟින් එම අතීත අත්දැකීම් පුනර්ජීවනය සිදුකිරීමත්ය. චෛත්‍යයක් නිර්මාණය කළ පුද්ගලයෙකුට මරණාසන්න අවස්ථාවේ දී එය පෙනීයාම මේ සඳහා නිදසුනක් ලෙස විභංගට්ඨකථාවේ දැක්වේ. එසේම වර්තමාන ඉන්ද්‍රියානුබද්ධ වස්තුවක් නව කර්මයක් කිරීම සඳහා හේතුවන අවස්ථා ද කර්ම නිමිති ලෙස දක්වා තිබේ. නිදසුනක් ලෙස අවසාන චිත්ත වීථියෙහි ජවන අවස්ථාවේ දී කිසියම් වස්තුවක් දැකීමෙන් ඒ පිළිබඳව තණ්හාව ඇතිවිය හැකිය. නැතහොත් මිය යන්නා වූ පුද්ගලයාගේ ඥාතියෙකු විසින් මල් හා සුවඳ දුම් වැනි දෑ ඉදිරිපත් කිරීමෙන් කුසල ජවන හෝ ඇතිවිය හැකිය.[23] රූප හා අරූප ධ්‍යාන සම්බන්ධ සංකල්පීය අරමුණු ද මරණය සම්බන්ධ ක්‍රියාවලියේ දී කර්ම නිමිති ලෙස දැක්විය හැකිය. මේ අනුව රූප ලෝකයෙහි ඉපදීමට ආසන්න වූ පුද්ගලයෙකුට ඔහුගේ අතීතයේ රූප ධ්‍යානයෙහි අරමුණු සිහිපත් වීමෙන් මරණයට ස්වල්ප මොහොතකට පෙර හෙතෙම ධ්‍යානලාභී වේ. ''ගති නිමිත්ත'' නම් වර්තමාන

---

[21] අභිධම්මත්ථසංගහ. පි. 24.

අභිධම්මාවතාර, පි. 117.

[22] තත්ථ කුසලං වා හොතු අකුසලං වා ගරුකාගරුකෙසු තං ගරුකං අකුසලපක්ඛෙ මාතුඝාතකාදී කම්මං කුසල පක්ඛෙ මහග්ගත කම්මං වා තදෙව පඨමං විපච්චති. සති වා ආසන්නාදී කම්මෙ පරිත්තං උදකං ඔත්ථරිත්වා ගච්ඡතො මහොඝො වියතථා හිතං ගරුකංති වුච්චති. තස්මිං අසති දූරාසන්නෙසු යං ආසන්නං මරණ කාලෙ අනුස්සරිකං තදෙව පඨමං විපච්චති. ආසන්නකාලෙ කතෙ වත්තබ්බං එව නත්ථි. තස්මිං අසති ආචිණ්ණාචිණ්ණ කම්මෙසු ච යං ආචිණ්ණං සුසීල්‍යං වා දුසීල්‍යං වා තදෙව පඨමං විපච්චති. කටත්තා කම්මං පන ලද්ධාසෙවනං පුරිමානං අභාවෙන පටිසන්ධිං ආකඩ්ඪති.

[23] විභංගට්ඨකතා, පි. 156.

ඉන්ද්‍රියානුබද්ධ අරමුණකි. එහෙත් එය මනෝද්වාරය තුළින් පමණක් දක්වන ලද්දක් ලෙස සඳහන් වේ.[24] මෙබඳු අරමුණු කාම ධාතුවෙහි සුඛිත හෝ දුක්ඛිත උප්පත්තියක් ලබන සත්වයන්ට පමණක් සීමා වේ. එබඳු අවස්ථාවන් තුළ දී සත්‍වයා තමා මරණයෙන් පසු යාමට නියමිත වූ ස්ථානයන් පවා දකී. මෙබඳු අරමුණක් සත්‍වයාගේ උප්පත්තිය ලබන ස්ථානය පිළිබඳ සංකල්පීය සළකුණක් නොවන අතර, එය මනෝද්වාරයෙන් දක්නා ලද වර්තමාන ඉන්ද්‍රියානුබද්ධ වූ අරමුණක් ලෙස අටුවා තුළ විග්‍රහ වේ. එනම් ඔහු එම අවස්ථාවේ දී මරණයෙන් පසු යාමට තිබෙන්නා වූ ස්ථානය දැකීමයි.

උක්ත කාරණාවන්ට අමතරව "චුතිය" පිළිබඳ ථෙරවාද සම්ප්‍රදායානුගත ඉගැන්වීම් පරීක්‍ෂා කර බැලීමේ දී, එය සියලු සත්‍වයන්ට ම පොදු වූ දෙයක් වුවත් ඒ ඒ සන්දර්භය තුළ ඒ ඒ සත්‍වයාට අනුව විශේෂත්‍වයක් ද උසුලන බව පෙනේ. නිදසුනක් ලෙස දෙවියන්ගේ චුතිය මනුෂ්‍ය චුතියට වඩා වෙනස් වූවකි. එම ගණයට අනුව අදින් සත් දිනකට පසුව චුතිය වෙතැයි ඔවුනට නිමිති පහළ වේ. මල් මැලවීම, වස්ත්‍ර කිලිටි වීම, කිසිල්ලේ දාඩිය දැමීම, කය දුර්වර්ණ වීම හා සිය අසුනෙහි රැඳීමට නොඇලීම යන කරුණු පසක් ඔවුනට චුතිය ආසන්නයේ දී නිමිති ලෙස පහළ වන බව පපඤ්චසූදනියෙහි පෙන්වා දී ඇත.[25]

---

[24] විසුද්ධිමග්ග, පිටු. 138-142.

[25] ම. නි., උපරිපණ්ණාසට්ඨකථා Chatta Sangayana CD Rom, Vipassana Research Institute Dhammagiri, Igatpuri,422 - 403 Disk, Nashik, India